ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 අප්‍රේල් මස 11 වැනි දින |


## 2013 ජනවාරි මාසයේ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

2013 ජනවාරි මාසයේ දී වෙළෙඳ හිඟය තවදුරටත් අඩු වූ අතර පෙර වසරේ අනුරූප කාලය සමග සැසඳීමේ දී සියයට 24 ක අඩුවීමක් වාර්තා කරන ලදී. අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය අධෛර්යමත් කිරීම සඳහා 2012 වසර ආරම්භයේ දී ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් හේතුවෙන් වෙළෙඳ හිඟය මත වූ පීඩනය තවදුරටත් අඩු වූ අතර, එමගින් ජංගම ගිණුමේ ශේෂය මත ඇති පීඩනය ද අඩු විය. අපනයන සඳහා වන ගෝලීය ඉල්ලුම මන්දගාමීවීමෙන් ඇති වූ අයහපත් බලපෑම සමනය කිරීම සඳහා මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් ඉවහල් විය. 2013 ජනවාරි මාසයේ දී සතුටුදායක මට්ටමක පැවතුණ සේවා අපනයන ආදායම ජංගම ගිණුම තවදුරටත් ශක්තිමත් කිරීමට උපකාරී වූ අතර, එමගින් ගෙවුම් ශේෂය මෙන්ම ජාත්‍යන්තර සංචිත සතුටුදායක මට්ටමක පවත්වා ගැනීමට හැකියාව ලැබුණි.

ආනයන වියදම අඩු කිරීම සඳහා 2012 වසර ආරම්භයේ දී හඳුන්වා දුන් ප්‍රතිපත්තීන්ගේ සාර්ථකත්වය පිළිබිඹු කරමින්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2013 ජනවාරි මාසය සඳහා ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,507 ක් දක්වා සියයට 21.3 කින් පහත වැටුණි. පිරිපහදු බනිජ තෙල් ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2013 ජනවාරි මාසයේ දී සියයට 58.4 කින් පහත වැටුණු අතර ජල විදුලි උත්පාදනය ඉහළ යාම ද මේ සඳහා හේතු විය. ප්‍රවාහණ උපකරණ, රත්‍රං සහ රථවාහන ආනයන වියදම අඩුවීම, 2013 ජනවාරි මාසයේ ආනයන වියදම පහත වැටීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. කෙසේවෙතත්, ආනයනයන්ගෙන් සියයට 11 කට පමණ දායකත්වය ලබා දෙන රසායනික නිෂ්පාදිත, කෘෂිකාර්මික

යෙදවුම්, ප්ලාස්ටික් හා ප්ලාස්ටික් නිෂ්පාදිත සහ තිරිඟු හා ඉරිඟු ආදී ඇතැම් අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2013 ජනවාරි මාසයේ දී ඉහළ ගියේය. පෙර වසරේ අනුරූප කාලය සමග සැසඳීමේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2013 ජනවාරි මාසයේ දී පහත වැටුණු අතර, ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවද, ආයෝජන භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම 2013 ජනවාරි මාසයේ දී ඉහළ යන ලදී. පාරිභෝගික භාණ්ඩ සැලකීමේ දී, ආහාර හා පාන ආනයනය මෙන්ම, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ද පහත වැටුණි. පෙර වසරේ අනුරූප කාලය සමග සැසඳීමේ දී සියයට 51.7 කින් පහත වැටුණු රථවාහන ආනයන, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටීම සඳහා වැඩිම දායකත්වයක් ලබා දී ඇත.

යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි ප්‍රධාන අපනයන ගමනාන්තයන් මන්දගාමී ලෙස යථා තත්ත්වයට පත්වීම අපනයන ඉල්ලුම කෙරෙහි තවදුරටත් අයහපත්ව බලපෑ අතර, ඒ හේතුවෙන් 2013 දී අපනයන ආදායම තවදුරටත් පහත වැටුණි. පසුගිය වසරට සාපේක්ෂව සියළුම ප්‍රධාන අපනයන භාණ්ඩවලින් ලද ආදායම අඩුවීම හේතුවෙන් 2013 ජනවාරි මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 727 ක් දක්වා සියයට 18.2 කින් අඩු විය. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන සියයට 20.7 කින් පහත වැටීම හේතු විය. රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සියයට 8.9 කින් අඩු විය. ගමනාගමන උපකරණ, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ රබර් නිෂ්පාදිත, අපනයන ආදායම අඩු වීම කෙරෙහි සැලකිය යුතු ලෙස දායක වූ අනෙකුත් අපනයන කාණ්ඩයන් වේ. සාම්ප්‍රදායික කෘෂිකාර්මික අපනයන සහ සාම්ප්‍රදායික නොවන කෘෂිකාර්මික අපනයන යන කාණ්ඩ දෙකෙහිම සිදු වූ අඩු වීම හේතුවෙන් 2013 ජනවාරි මස කෘෂිකාර්මික අපනයන ආදායම අඩු විය. තේ අපනයන සඳහා යහපත් මිලක් ලබාගැනිමට හැකි වුවද, ප්‍රධාන තේ අපනයන වෙළෙඳපොළවලින් ලද ඉල්ලුමෙහි අඩු වීම හේතුවෙන් ජනවාරි මස තේ අපනයන ආදායම අඩු විය. එසේ වුවත්, දායකත්වය අඩු අගයක පැවතිය ද හරිත තේ අපනයන ආදායම පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය විය. ගෝලීය වශයෙන් ස්වාභාවික රබර් මිල අඩු වී ඇති අතර රබර් අපනයන පරිමාව අඩු වීම සඳහා රබර් ආශ්‍රිත නිෂ්පාදිත සිදුකරන දේශීය නිෂ්පාදකයන්ගේ ඉල්ලුම ද මේ සඳහා හේතු විය. සාම්ප්‍රදායික නොවන කෘෂිකාර්මික නිෂ්පාදන අතුරින් කුළුබඩු අපනයනයෙන් ලද ආදායම 2013 ජනවාරි මස වර්ධනය වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් ගම්මිරිස් සහ කරාබුනැටි අපනයනයන්ගේ ප්‍රශංසනීය ක්‍රියාකාරිත්වය හේතු විය. තවද, සකස් නොකළ දුම්කොළ අපනයනයෙන් ලද ආදායම 2013 ජනවාරි මස මද වශයෙන් වර්ධනය විය.




2012 වසරේ අනුරූප මාසය සමග සැසඳීමේ දී, 2013 වසරේ ජනවාරි මාසයේ සංචාරක පැමිණීම්, 97,411 දක්වා සියයට 13.4 කින් ඉහළ ගිය අතර, සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 107 ක් දක්වා සියයට 20.5 ක හිතකර වර්ධනයක් පෙන්වීය. 2012 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 473 ක් වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2013 වසරේ ජනවාරි මාසයේ දී සියයට 10.8 ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ.ඩොලර් මිලියන 524 ක් විය.

2012 වසරේ ජනවාරි මාසයේ දී කොළඹ කොටස් වෙළෙඳපොළෙහි විදේශ ආයෝජකයන්ගේ ශුද්ධ විදේශ මිලදී ගැනීම් එ.ජ.ඩොලර් මිලියන 4 ක් ලෙස වාර්තා වූ අතර, එය 2013 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 10.4 ක ශුද්ධ විකුණුම් ලෙස වාර්තා විය. කෙසේ වුවත්, 2012 වසරේ ජනවාරි මාසය සමග සැසඳීමේ දී 2013 වසරේ ජනවාරි මාසයේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ ගනුදෙනු ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත වූ විදේශීය ආයෝජන ලැබීම් ප්‍රමාණය කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, 2012 වසරේ ජනවාරි මාසයේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 170 ක ශුද්ධ ලැබීම්වලට සාපේක්ෂව 2013 වසරේ ජනවාරි මාසයේ දී භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර සඳහා එ.ජ.ඩොලර් මිලියන 289 ක ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය. මීට අමතරව, 2013 වසරේ ජනවාරි මාසයේ දී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 125 ක් විය.

2013 වසරේ ජනවාරි මාසය අවසාන වන විට, දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 6,855 ක් වූ අතර, දළ නිල සංචිත සහ වාණිජ බැංකුවල විදේශීය වත්කම් ඇතුළත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය 2013 වසරේ ජනවාරි මාසය අවසාන වන විට එ.ජ.ඩොලර් මිලියන 8,538 ක් විය. විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2013 වසරේ ජනවාරි මාසය අවසාන වන විට දී පැවැති දළ නිල සංචිත සහ මුළු විදේශීය සංචිත ප්‍රමාණය පිළිවෙළින් ආනයනික මාස 4.4 කට සහ 5.5 කට සමාන විය.

## සංඛ්‍යා සටහන 1. විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් ජනවාරි - 2013 [අ]

| කාණ්ඩය | 2012 ජන. එ.ජ.ඩො. මිලියන | 2013 ජන. එ.ජ.ඩො. මිලියන | ජන. වර්ධනය (සියයට) |
|---|---|---|---|
| **අපනයන** | **888.2** | **726.7** | **-18.2** |
| *මෙයින්,* | | | |
| කෘෂිකාර්මික | 181.5 | 167.0 | -7.9 |
| *මෙයින්,* තේ | 103.9 | 101.0 | -2.8 |
| කාර්මික | 703.0 | 557.7 | -20.7 |
| *මෙයින්,* | | | |
| රෙදිපිළි හා ඇඟළුම් | 366.6 | 333.9 | -8.9 |
| රබර් නිෂ්පාදිත | 78.2 | 62.8 | -19.8 |
| ආහාර, පාන හා දුම්කොළ | 20.8 | 12.4 | -40.3 |
| ඛනිජ ද්‍රව්‍ය | 2.6 | 1.0 | -60.4 |
| **ආනයන** | **1,915.0** | **1,507.2** | **-21.3** |
| *මෙයින්,* | | | |
| පාරිභෝගික භාණ්ඩ | 287.7 | 246.8 | -14.2 |
| *මෙයින්,* ආහාර හා පාන වර්ග | 124.5 | 114.2 | -8.2 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 163.2 | 132.6 | -18.8 |
| අන්තර් භාණ්ඩ | 1,096.5 | 819.6 | -25.3 |
| *මෙයින්,* ඛනිජ තෙල් | 515.1 | 269.7 | -47.6 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 203.0 | 203.2 | 0.1 |
| ආයෝජන භාණ්ඩ | 523.3 | 440.2 | -15.9 |
| *මෙයින්,* යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 250.3 | 250.1 | -0.1 |
| ප්‍රවාහන උපකරණ | 144.7 | 52.7 | -63.6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 127.7 | 137.0 | 7.2 |
| **වෙළෙඳ ශේෂය** | **-1,026.8** | **-780.4** | **-24.0** |
| **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** | **472.8** | **524.0** | **10.8** |
| **විවිධ ආයෝජන (ශුද්ධ)** | **4.1** | **-10.4** | |
| **සංචාරක ඉපැයීම්** | **88.9** | **107.2** | **20.5** |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ආ)** | **325.7** | **801.8** | **146.2** |
| මෙයින්, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 229.6 | 676.2 | 194.5 |
| දිගු කාලීන ණය | 95.7 | 125.1 | 30.6 |

(අ) තාවකාලික

(ආ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.